# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2139/25 - 2019 සැප්තැම්බර් මස 03 වැනි අඟහරුවාදා - 2019.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 94112 සහ 2013.08.23 වැනි දින පළමුවරට ලියාපදිංචි කර 2018.02.02 වැනි දින ඒකාබද්ධ කරන ලද කොළඹ 04, ද ෆොන්සේකා පෙදෙස, අංක 03 යන ස්ථානයෙහි පිහිටා ඇති ආයතනයක් වන සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති, එයට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අදාළ කෙටි යෙදුම දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මෙම නියමය මගින් පිළිගනු ලැබේ :

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව කොළඹ 04, ද ෆොන්සේකා පෙදෙස, අංක 03 යන ස්ථානයෙහි දී පමණක් පැවැත්විය යුතු ය.

2. සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මේ නියෝගය යටතේ පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන ආයතනය, එම ආයතනය නමින් ලියාපදිංචි කරන ලද ස්ථානයක පිහිටුවීම පිළිබඳව වන සාක්ෂිය, මේ නියමය පළ කරන දින සිට අවුරුදු පහක් (5) ඇතුළත නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. අදළ උපාධිය නියමිත අවුරුදු පහක (5) කාලය තුළ සම්පූර්ණ කිරීමට ඔවුන්ට හැකි වන පරිදි සිසුන් ඇතුළත් කර ගැනීමට යටත්ව, සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා මේ නියමය පළ කරන දින සිට අවුරුදු පහක (5) කාලයක් සඳහා පමණක් අවසර දෙනු ලැබේ.

4. ඉහත කී අවුරුදු පහක (5) කාලසීමාව තුළ ඇතුළත් වන සිසුන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදළ උපාධි පාඨමාලාව, එකී අවුරුදු පහ (5) ඇතුළත සම්පූර්ණ කළ යුතු බවට සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් වගබලා ගත යුතු ය.

5. මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා, නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලැබිය යුතු පාඨමාලා ප්‍රතිසමාලෝචනය කිරීමකට යටත්ව, සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අවසර දෙනු ලබේ.

6. සීමාසහිත ඊසොෆ්ට් මෙට්රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, තොරතුරු තාක්ෂණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් "සාමාන්‍ය සාමාර්ථ" (S) තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| තොරතුරු තාක්ෂණවේදී ගෞරව | බීඅයිටී (ගෞරව) |

**අ. ඉබතුල් රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

09 - 559